# අ.පො.ස. (සා.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2014

## සිංහල භාෂාව හා සාහිත්‍යය - I පත්‍රය
## පිළිතුරු සඳහා මඟ පෙන්වීම

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|
| 1 | 4 |
| 2 | 3 |
| 3 | 1 |
| 4 | 2 |
| 5 | 4 |
| 6 | 3 |
| 7 | 1 |
| 8 | 4 |
| 9 | 2 |
| 10 | 1 |
| 11 | 3 |
| 12 | 2 |
| 13 | 3 |
| 14 | 2 |
| 15 | 3 |
| 16 | 1 |
| 17 | 4 |
| 18 | 2 |
| 19 | 4 |
| 20 | 1 |

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|
| 21 | 3 |
| 22 | 1 |
| 23 | 3 |
| 24 | 4 |
| 25 | 2 |
| 26 | 1 |
| 27 | 3 |
| 28 | 2 |
| 29 | 1 |
| 30 | 3 |
| 31 | 2 |
| 32 | 3 |
| 33 | 1 |
| 34 | 2 |
| 35 | 1 |
| 36 | 4 |
| 37 | 2 |
| 38 | 3 |
| 39 | 2 |
| 40 | 4 |

2 වන පිටුව බලන්න

## අ.පො.ස. (සා.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2014
## සිංහල භාෂාව හා සාහිත්‍යය II
## පිළිතුරු සඳහා මග පෙන්වීම

1. I (අ) කණ්ඨජ අක්ෂර
අ, ආ, ඇ, ඈ, ක, ඛ, ග, ඝ, ඞ, හ, ඟ
(ආ) අන්තඃස්ථාක්ෂර
ය, ර, ල, ව

II (අ) නිවාර්ය/වෛකල්පික,
(ආ) මුග්ධ/අවිදග්ධ

III (අ) ප්‍රයෝජ්‍ය ක්‍රියා
(ආ) (අනියමාර්ථ) අසම්භාව්‍ය ක්‍රියා

IV (අ) සුර + ඉඳු
(ආ) ළිඳ + පඩිය

V (අ) අභ්‍යවකාශ
(ආ) ව්‍යංගාර්ථවත්

VI (අ) රෝහල තුළ කිසිවෙකු සිටියේ නැත.
(ආ) ගුරුවරියක මෙන් සැරසුණු දැරිය පාසලේ විවිධ වේශ නිරූපණ සංදර්ශනයකට සහභාගි වූවාය.

VII (අ) නිපාත
(ආ) කරණ විභක්ති/විශේෂණ සමාස

VIII (අ) බැතිමතුන් විසින් විවිධ පුද පූජා පවත්වමින් දෙවියෝ පිදෙති/පිදෙත්/පුදනු ලබති/පුදනු ලබත්/පුදනු ලැබෙත්.
(ආ) ග්‍රාම නිලධාරිතුමා විසින් තම ප්‍රදේශයේ නියං ආධාර බෙදා දීමට පැමිණි ව්‍යාපාරිකයෝ සාදරයෙන් පිළිගැනුණහ/පිළිගන්නා ලදහ/පිළිගැනුණු/පිළිගන්නා ලද්දෝය/පිළිගන්නා ලදු.

IX (අ) රසායනික, කිනිති

X (අ) දිගිලිය - වැවට වතුර ගෙන එන දිය මංවල පිහිටීම අනුව කලින්ම ගිල්ම ගහන (වතුර පිරෙන) කොටස
(ආ) අමුණ - ගංගා, නදී හරස් කර ජලය රඳවා තැබීමට ගත් ප්‍රදේශය

**(එක් නිවැරදි පිළිතුරකට ලකුණු 02 බැගින් ලකුණු 20 යි.)**

2. **රචනය**

**ලකුණු විග්‍රහය :-**

01. සාරවත්භාවය, මාතෘකාව ද ඇතුළුව — ලකුණු 08 යි
02. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය — ලකුණු 12 යි
03. ශිල්පීය දක්ෂතා හා ඡේද බෙදා ලිවීම — ලකුණු 05 යි

01. සාරවත්භාවය — ලකුණු 07 යි
විස්තරයට අදාළ වන පරිදි මාතෘකාවක් යොදා තිබීම — ලකුණු 01 යි

මාතෘකාවට අදාළ බව, ඉදිරිපත් කොට ඇති ව්‍යූහයට සමීප බව යන කරුණු සාරවත්භාවය යටතේ සැලකිල්ලට ගත යුතු වේ.

02. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය — ලකුණු 12 යි

මෙහි දී උසස් හා නිර්මාණාත්මක ප්‍රකාශන ශක්තිය, සංවිධානය, ස්වීයත්වය, ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය ආදි අංශ ගැන සලකා බැලිය යුතුය.

03. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම — ලකුණු 05 යි

වියරණ, අත් අකුරු, විරාම ලක්ෂණ භාවිතය, ඡේද අදාළ පරිදි වෙන් කොට තිබීම, පද වෙන් කොට ලිවීම, වචන ගණන 250ට සමීපව පැවතීම යන අංශ ගැන සලකා බලා ලකුණු තීරණය කළ යුතු වේ.

2 වන පිටුව බලන්න

**යෝග්‍ය මාතෘකා :-**

(අ) * මාර්ග සංවර්ධනය හා වර්තමාන ශ්‍රී ලංකාව
* මාර්ග සංවර්ධනයෙන් යහපත් ඵල ලැබීම

(ආ) * ළමා පරපුර රැකගැනීම අපේ වගකීමයි.
* වර්තමාන ළමා පරපුර හමුවේ ඇති අභියෝග

(ඉ) * සන්නිවේදනය හා තාක්ෂණික දියුණුව
* සන්නිවේදන තාක්ෂණය හා නූතන ලෝකය

(ඊ) * ළමා පරපුර හා ක්‍රීඩාව
* නිරෝගී දිවියකට ක්‍රීඩාව

**(මුළු ලකුණු 25 යි)**

3. **සාරාංශය**

ලකුණු විග්‍රහය : **මුළු ලකුණු 10 යි.**
1. අන්තර්ගතය - ලකුණු 06 යි.
2. වචන ගණන - ලකුණු 02 යි.
3. ශිල්පීය දක්ෂතා - ලකුණු 02 යි.

අපේක්ෂිත ප්‍රධාන අදහස්
* වානර වර්ග දෙකක් ඇති බව.
* මානව වානරයා මිනිසුන්ට බොහෝ දුරට සමාන බව.
* ඔවුන්ගේ මොළය කුඩා වන අතර ඇවිදීමට හා කථා කිරීමට නොහැකි බව.
* අප්‍රිකාවේ ගොරිල්ලා, මලයා දේශයේ චිම්පන්සි, ඔරං උටං මීට අයත් බව.
* අනිත් වර්ගයා සාමාන්‍ය වඳුරු ජාතිය වන අතර ඔවුන් වලිග ඇති හා නැති වශයෙන් දෙකොටසකට බෙදේ.
* එසේම පැරණි ලෝකයට හා අලුත් ලෝකයට අයත් අය ලෙස ද වර්ග කෙරේ.

4. ලකුණු විග්‍රහය - මුළු ලකුණු 10 යි.
(එක් කෙටි ප්‍රශ්නයකට ලකුණු 02 බැගිනි.)

අපේක්ෂිත පිළිතුරු
1. ගෘහීය කටයුතුවල යෙදීම, පැළ සිටුවීම, මල් නෙළීම, අස්වනු නෙළීම, අස්වැන්න ගබඩා කිරීම.
2. දීග විවාහය, බින්න විවාහය
3. කෘෂි කර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය කර ගැනීම.
4. දීග විවාහයක දී කාන්තාව නිශ්චිත දේපළවලට උරුමකම් කීම.
බින්න විවාහයක දී පිරිමියාට නිශ්චිත දේපළවලට අයිතිවාසිකමක් හිමි නොවීම.
5. නව පවුල් ඒකකයේ ආර්ථික සමබරතාව ආරක්ෂා කර ගැනීමට හැකි වීම.

**(එක් පිළිතුරකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 10 යි)**

5. ලකුණු විග්‍රහය - **මුළු ලකුණු 15 යි**
1. ආකෘතිය ලකුණු 03 යි
2. අන්තර්ගතය ලකුණු 09 යි
3. ශිල්පීය දක්ෂතා ලකුණු 03 යි

ආකෘතිය :
1. ඉල්ලුම් පත්‍රයේ මාතෘකාව
2. අත්සන
3. දිනය

3 වන පිටුව බලන්න

අන්තර්ගතය :

1. සම්පූර්ණ නම
2. මුලකුරු සමග නම
3. ලිපිනය
4. දිස්ත්‍රික්කය
5. පළාත
6. වයස
7. අධ්‍යාපන සුදුසුකම්
8. පරිගණක පුහුණුව
9. ඉදිරිපත් කිරීමේ ක්‍රමවත් භාවය

ශිල්පීය දක්ෂතා

නිවැරදි අක්ෂර වින්‍යාසය
උක්තාඛ්‍යාත සම්බන්ධය
විරාම ලක්ෂණ
පැහැදිලි අත් අකුරු

**නැතහොත්**

ආකෘතිය :

මාතෘකාවට ලකුණු 02
සංක්ෂිප්ත බව ලකුණු 01
නිර්මාණශීලි බව ලකුණු 01

අන්තර්ගතය ලකුණු 08 (පහත සඳහන් කරුණුවලට 01 ලකුණ බැගින්)

- විදුහලේ නම
- වැඩ සටහනේ අරමුණු
- තරගය පැවැත්වෙන ස්ථානය
- දිනය හා වේලාව
- තරගය පැවැත්වෙන අංශ
- පැවැත්වෙන තරග
- සංවිධානය කරන්නෝ
- ලේකම්ගේ අත්සන

ශිල්පීය දක්ෂතා : ලකුණු 03

නිවැරදි අක්ෂර වින්‍යාසය හා පද බෙදීම, උක්තාඛ්‍යාත පද සම්බන්ධය, නියමිත වචන ගණනට ළං වීම.

# අ.පො.ස. (සා.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2014
## සිංහල භාෂාව හා සාහිත්‍යය III
## පිළිතුරු සඳහා මග පෙන්වීම

1. (i) (අ) චිත්‍රවලට ලකුණු වැඩි ම ළමයාට අත ඔසවන්න යැයි පද්මා මිස් කියූ අවස්ථාව
(ආ) සිරියාවතී

(ii) (අ) වේසක් නොවී සමගිවැ සැප විඳ ඉන්ට
දාසක් ආයු ඇත අප සඳ කිඳුරන්ට
(ආ) මෙය ශක්‍රයා නුදුටු කල්හි

(iii) (අ) ලව්නේරිස්ට
(ආ) ගෝනහේන ඉඩමේ අයිතිය පිළිබඳව ඇති වූ ආරවුල

(iv) (අ) අමෘතය වැනි වූ/බඳු වූ
(ආ) මහනුවර යුගයේදී

(v) (අ) නිධානයටයි.
(ආ) II ධර්මකීර්ති හිමි, (දේවරක්ඛිත ජයබාහු, ජයබාහු ධර්මකීර්ති)

(vi) (අ) තමා හතරේ පන්තියට යන දිනය
(ආ) තහනම් දේශයකින් පද්‍ය ග්‍රන්ථයෙන්

(vii) (අ) බාබු සහීබ්ගේ මව විසින්
(ආ) ඩබ්ලියු.ඒ. අබේසිංහ

(viii)(අ) හෝමය/යාගය
(ආ) උලකුඩය දේවියගේ

(ix) (අ) පූජාවලිය
(ආ) තමන්ගේ සහජාත පුත්‍රයා බව දැනගැනීම

(x) (අ) පසේ බුදුන් වහන්සේ විසින්
(ආ) බත් බැළයා පිළිබඳ ව **(ලකුණු 2 x 10 = 20 යි)**

2. ලකුණු විග්‍රහය : **මුළු ලකුණු 20යි.** (එක් කොටසකට ලකුණු 05 බැගින්)
තද කළු අකුරින් ඇති එක් එක් වචනයට නිවැරදිව තේරුම ලියා ඇත්නම් එක වචනයකට
ලකුණු 01 බැගින් - ලකුණු 02 යි
සමස්ත අර්ථයට ලකුණු 03 යි

(අ) ගී දේවියට - සරස්වතී දේවියට
කළුවැල් - අගිල් සුවඳ

සරස්වතී දේවිය වෙනුවෙන් වෙන් කළ දේවාලයකට සමාන මෙම කුටියෙහි අගිල් සහ කපුරු දුම සුවඳ ලබා දෙයි. අද දින මා වෙසෙන ගම නුවරඑළියට සමාන වන අතර මෙතරම් අලස දිනයක් මා දැක නැත.

(ආ) මෝරවය - කෑම ගන්නා භාජනය තබන මොනර පාද අයුරින් සැකසූ අඩිය
උයි - ඔහු

ඔහු ඉදිරියේ කෑම ගන්නා භාජනය තබන මොනර පාද අයුරින් සැකසූ අඩිය තබා එය මත රන් තළිය තබා ලක්ෂයක් වටිනා බත් එහි තැන්පත් කරති. ඔහු නළුවන් පිරිවරාගෙන සියලු සම්පත් සහිතව බත් කයි.

(ඉ) ප්‍රත්‍යය - හේතු
එකනින්නාද - හැම තැන ම නාදය පතුරුවා

ඒ ආකාරයෙන්ම යම් වෙනත් මනුෂ්‍යයෙකු උපක්‍රමශීලී නොවී තමා වස්තුවට ආශාවෙන් උත්සාහ කළොත් සියලු ආකාරයෙන් ම ඔහුත් විනාශයට පත් වේ. අන් අයටත් විනාශයට හේතු වන්නේ යැයි වනයේ හැම තැන ම නාදය පතුරුවා දෙවියන් සාධුකාර දෙමින් සිටියදී.

5 වන පිටුව බලන්න

(ඊ) නෙතැන - නොයෙක් තැන්වල
වවුලු පළවල් - වවුලන් කෑම කන තැන්
ගමේ ම පුහුලම් ඉදී ඇති අතර වවුලෝ ඒවා සොරාගෙන වවුලන් කෑම ගන්නා නොයෙක් තැන්වලට යති. මේ නිසා ගමේ දරුවන්ට වැඩ (කජු ඇහිලීම) වැඩි වී ඇත.

3. (අ) වේදබ්භ ජාතකය ඇසුරින් දුර්වච බවෙහි විපාක දැක්වෙන අවස්ථා
   * වේදබ්භ බමුණා ශිෂ්‍යයාගේ වචනයට කීකරු නොවීම.
   * වේදබ්භ බමුණාගේ ප්‍රකාශයට දෙවෙනි සොරු කණ්ඩායම කීකරු නොවීම.
   * දුර්වච බව නිසා දහසක් අය විනාශ වීම.

(ආ) දූර්දර්ශීව ඉවසිලිවන්තව බුද්ධිමත්ව තීරණ ගැනීම නිරූපණය වන අවස්ථා
   * ශිෂ්‍යයා තම ගුරුවරයාට පෙර නක්ෂත්‍රයෝගය ලැබූ දිනය හඳුනා ගැනීම.
   * සොරුන්ට වස්තුව ලබාදීමෙන් වන අයහපත දූර්දර්ශීව දැකීම.
   * ගුරුවරයාට අවසන් බුහුමන් දක්වා ඉවසිලිවන්තව සිදුවූ දෙය සොයා ගොස් විශාල ධනයකට හිමිකම් ලැබීම.

උදාහරණ සඳහා - ලකුණු 04 යි.
සමස්ත විස්තරයට - ලකුණු 11 යි.
**මුළු ලකුණු 15 යි.**

**නැතහොත්**

(අ) ජීවක කථා වස්තුවෙන් තත්කාලීන සමාජ තොරතුරු දැක්වෙන අවස්ථා
   * අධ්‍යාපනය ගුරු ගෙදර ක්‍රමය අනුව රජ, සිටු, ප්‍රභු පැලැන්තියට පමණක් සීමාවීම.
   * වේශ්‍යා වෘත්තියට යම් සමාජ පිළිගැනීමක් තිබුණු බව.
   * කලාශිල්ප හා විද්‍යා විෂයයන් විශාල ප්‍රමාණයක් සහිත දියුණු අධ්‍යාපන ක්‍රමයක් තිබූ බව.
   * දියුණු වෛද්‍ය විද්‍යා දැනුමක් සහිත වෛද්‍යවරුන් සිටි බව.

(ආ) වෛද්‍යවරයෙකු සතු දැනුම් සම්භාරය එළි දැක්වෙන අවස්ථා
   * සූක්ෂම ශෛල්‍යකර්ම සිදුකිරීම.
   * රෝග නිදානය හඳුනා ගැනීමේ සුවිශේෂ දක්ෂතා තිබූ බව.
   * රෝග සඳහා සාර්ථක හා යෝග්‍ය ලෙස ප්‍රතිකාර කිරීම.
   * රෝගී මනස සුවපත් කිරීමෙන් කායික මානසික සුවය සැලසෙන ලෙස කටයුතු කිරීම.

උදාහරණ සඳහා - ලකුණු 04 යි.
සමස්ත විස්තරයට - ලකුණු 11 යි.
**මුළු ලකුණු 15 යි.**

4. (අ) අතිශය දුක්ඛදායක අත්දැකීමක් මනහර ලෙස නිරූපණය කිරීම.
   * අසරණ මව ඉල්ලන දේ දක්වා ඇති අයුරු
     කිසාගෝතමියක ලෙසින් ඇය ..........................
   * දරුවා සෙමෙන් මිය යන අවස්ථාව දක්වා ඇති අයුරු
     ඇගේ ළමැදෙහි ගුළිව නිහඬව ........................
   * දරුවා මියගිය බව දක්වා ඇති ආකාරය
     මවක් ඉකි බිඳ වැළපෙනා හඬ ........................

(ආ) උචිත කාව්‍යෝපක්‍රම දක්වා ඇති අයුරු
ව්‍යංග්‍යාර්ථ භාවිතය
   * දරුවා මිය ගිය බව නොකියා එය ප්‍රකාශ කරන ආකාරය
     මංසලෙන් සල නැඟු තොරණින් .......................
   * ධ්වනිතාර්ථවත් බව
     දෑස කඳුලින් තෙමී අඳවුණ .......................
   * සංකේත භාවිතය
     පාලු වීදිය වසා මතු විය .....................

උදාහරණ සඳහා - ලකුණු 04 යි.
සමස්ත විස්තරයට - ලකුණු 11 යි.
**මුළු ලකුණු 15 යි.**

**නැතහොත්**

(අ) පොළෝ කුහරයෙන් පැමිණි මිනිසා කෙටිකතාවෙන් සමාජ විෂමතා එළි දැක්වීම.
- පොත් මිටිය ඔසවා ගෙන යෑමට කුලීකරුවෙකු සෙවීම
- බාබු සහීබ්ගේ මව රාසල් ජූට බැණ වදින ආකාරය
- කොන්ත්‍රාත්කරුවන් සම්බන්ධයෙන් රාසල් ජූ කරන ප්‍රකාශය

(ආ) රාසල් ජූ චරිතයෙන් ශ්‍රේෂ්ඨ මිනිසෙකු නිරූපණය වන ආකාරය
- රාසල් ජූ බාබු සහිබ්ට උදව් කළේ ලාභ අපේක්ෂාවෙන් තොරවය.
- රාසල් ජූ බාබු සහිබ්ගේ පොත් මිටිය රැගෙන පලා යෑමට උත්සාහ නොකිරීම.
- මනුෂ්‍යත්වය මුදලට වඩා වටිනා බව දුප්පත් මිනිසා වටහා ගෙන තිබීම.

උදාහරණ සඳහා - ලකුණු 04 යි.
සමස්ත විස්තරයට - ලකුණු 11 යි.
**මුළු ලකුණු 15 යි.**

5. ගැමි විශ්වාස පදනම් කරගත් දරු සිහින විචිත්‍ර ලෙස දක්වා තිබීම.
- මැණික්, තරු, රිදී, පර්වත ආදිය දකින අයුරු දක්වා තිබීම.
  මැණිකක් දකින කොට ගැබ ඇතුළට වැදුනේ ............
  සීනෙන් තරුව ගිලුණා මගෙ ගැබ තුළට ..............
- පිරුණු සඳමඩල සීනෙන් දැකීම
  පුන්සඳ මඩල අහසින් ඒ යහන පිට ............
- සුදු නයි දැකීම පුත්‍ර ලාභ සඳහා පෙර නිමිතිය
  රිදී කඳකි නයි පැටියෙකි දෙරණ වට ...........

උදාහරණ සඳහා - ලකුණු 03 යි.
සමස්ත විස්තරය සඳහා - ලකුණු 07 යි.
**මුළු ලකුණු 10 යි.**

6. ගැමි සමාජය ඇසුරින් තෝරාගත් වචන හා උපමා සහිත භාෂාව භාවිත කර ඇති ආකාරය
   ගැමි වචන - වරෝ යම්හ, කොකු මස්සක්
   විස්මය නැත්තාට ආශ්චර්යක් නැත
   උපමා භාවිතය - කැරලුන් මහෝත්සාහයෙන් ...........
   ඇවිලෙමින් තිබූ පහනේ ..........
   පෙර දෙපෝදා සඳ පරිද්දෙන් .........

උදාහරණ සඳහා - ලකුණු 03 යි.
සමස්ත විස්තරය සඳහා - ලකුණු 07 යි.
**මුළු ලකුණු 10 යි.**

7. කාව්‍යමය චින්තා පහළ කරමින් වැස්ස පිළිබඳ අපූර්ව චිත්‍රයක් මවා ඇති ආකාරය
- වැස්සත් සමග ඇති වන දැඩි අඳුර සහ සීතල බව
  සුළඟට විදුලියට ගිගුරුමට හඬ ගගා .........
- ඇළ දොළ පිරී යාම දක්වා ඇත්තේ
  ඇළ දොළ ගලා බස්වන්නට ඉවුරු කඩා ..............
- නිමාවක් නැති වැස්සෙන් වෙහෙසට පත්වීම
  වෙහෙසට පත්ව වට වැසි බිඳු පොකුරු ගිල ...............
- ස්වාභාවික සිදුවීම දක්වන අයුරු
  ගස්වැල් තිගැස්සෙයි මේ කුළු ගැටෙන හඬින් ..................

උදාහරණ සඳහා - ලකුණු 03 යි.
සමස්ත විස්තරය සඳහා - ලකුණු 07 යි.
**මුළු ලකුණු 10 යි.**